## රේගු නිවේදනයයි

## ආදායම් සංරක්ෂණ ආඥාව - අංක 04/2018

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ඔහු විසින් පනවන ලද පහත සඳහන් ආඥාව මහජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රසිද්ධ කරනු ලැබේ.

ආර්. එච්. එස්. සමරතුංග
ලේකම්
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

2018 මැයි මස ...02...වැනි දින
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේදීය.

## 1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනත

## ආඥාව

1962 අංක 19 දරන ආදායම් සංරක්ෂණ පනතේ 2 වැනි වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය මංගල සමරවීර වන මම, 2018 මැයි මස ..........3........ වැනි දින සිට, මෙහි වූ උපලේඛනයෙහි 3 වැනි තීරුවෙහි නිශ්චිතව දක්වා ඇති භාණ්ඩ සඳහා එකී උපලේඛනයෙහි 5 වැනි තීරුවේ අනුරූප සටහන් වල දක්වා ඇති සාමාන්‍ය ගාස්තු ප්‍රමාණයන් අනුව හෝ (235 වැනි අධිකාරය වන) රේගු ආඥාපනතේ "අ" උපලේඛනයේ විධිවිධාන යටතේ වරණීය ගාස්තු ප්‍රමාණයන් අයකළ යුතු වන හා ගෙවිය යුතු වන අවස්ථාවක නම් එකී උපලේඛනයෙහි 4 වැනි තීරුවෙහි අනුරූප සටහන් වල දක්වා ඇති වරණීය ගාස්තු ප්‍රමාණයන් අනුව, ආනයන තීරු ගාස්තු අයකළ යුතු බව හා ගෙවිය යුතු බවට ද, රේගු අධ්‍යක්ෂ ජනරාල්ට මෙම ආඥාව මගින් නියම කරමි.

මංගල සමරවීර
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍ය

2018 මැයි මස .......1............වන දින
කොළඹ 01,
මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේදීය.

උපලේඛනය

| ශීර්ෂ අංකය (1) | සංයෝජිත වර්ගීකරණ සංකේතය (2) | | විස්තරය (3) | තීරුබදු ප්‍රමාණය වරණීය (4) | සාමාන්‍ය (5) | ප්‍රමාණ ඒකකය (6) |
|---|---|---|---|---|---|---|
| **14.04** | 1404.90.10 | --- | බීඩි කොළ | | 30% හෝ කි ග්‍රෑමයට රු 750/- | කි. ග්‍රෑ |
| **24.03** | 2403.19.20 | --- | බීඩි දුම්කොළ | | 85% හෝ කි ග්‍රෑමයට රු 150/- | කි. ග්‍රෑ |